# 11. අපට ඕනෑ දේ ලැබෙන හැටි

## ක්‍රියාකාරකම 1

- ඔබට අවශ්‍ය ද්‍රව්‍ය කිහිපයක් පහත කොටු අසල දක්වා ඇත. ඒවා කොටු තුල අඳින්න. රූපය පාට කරන්න.

සපත්තු

මේස්

බැග්

පොත්

පැන්සල්/ මකන

පැස්ටල් පෙට්ටි

ඇඳුම්

පාන්

පළා වර්ග

පළතුරු

චොක්ලට්

ක්‍රීඩා උපකරණ

එළවළු

ටොෆි

දර

- වෙළෙඳ පොලෙන් ලබා ගන්නා ද්‍රව්‍ය ඇතුලත් කොටුවට යටින් ඇති රවුම කහ පාටින් ද නිවසින් ලබා ගන්නා ද්‍රව්‍ය ඇතුලත් කොටුවට යටින් ඇති රවුම නිල් පාටින් ද පාට කරන්න.
- ඉහත සඳහන් ද්‍රව්‍ය පහත වගුව තුල ලියන්න.

| වෙළෙඳ පොලෙන් ලබා ගන්නා දේ | නිවසින් ලබා ගන්නා දේ |
|---|---|
| | |

- අපගේ අවශ්‍යතා සපුරා ලීමට උදව් ලබා දෙන ආයතන හා එයින් ලැබෙන සේවාවන් ගැලපෙන සේ යා කරන්න.

| | |
|---|---|
| 01. පොලීසිය | විදුලිය ලබා දීම |
| 02. රෝහල | ජලය ලබා දීම |
| 03. විදුලිබල මණ්ඩලය | ප්‍රතිකාර ලබා දීම |
| 04. ජලසම්පාදන මණ්ඩලය | ආරක්ෂාව ලබා දීම |
| 05. ශ්‍රී ලංකා ටෙලි කොම් | ඉන්ධන ලබා දීම |
| 06. ඉන්ධන පිරවුම් හල | දූරකථන පහසුකම් ලබා දීම |
| 07. බැංකුව | ලිපි ගනුදෙනු කිරිම |
| 08. තැපැල් කාර්යාලය | මුදල් ගනුදෙනු කිරිම |

❖ මෙම ආයතන වලින් සේවා සැපයීම සඳහා ඔබ නිවසට පැමිණෙන අය සිටී නම් ඔවුන් අඳින්න. ඔවුන් කවුරුන්දැයි රූපයට යටින් ඇති තිත් ඉරමත ලියන්න.

උදා :- ජල බිල්පත් මනු කියවන්නා

| | | |
|---|---|---|
| ........................ | ........................ | ........................ |
| ........................ | ........................ | ........................ |

## ක්‍රියාකාරකම 2

❖ සේවාවන් ලබා ගැනීමේ දී අප විසින් කළ යුතු දේවල් තෝරා √ ලකුණ ද නොකළ යුතු දේවල් තෝරා × ලකුණ ද ඉදිරියෙන් ඇති කොටුව තුළ යොදන්න.

| | | |
|---|---|---|
| 01. | බඩු ගෙන ඒමට වෙළෙඳපොලට රෙදි බෑගයක් රැගෙන යාම. | |
| 02. | පොලිතින් වල ඇසුරූ ද්‍රව්‍ය අඩුවෙන් භාවිත කිරිම. | |
| 03. | තමන්ගේ වාරය එන තෙක් රැදී සිටිම. | |
| 04. | බඩු මිලදී ගැනීමේදී වෙළෙඳුන් සමග ගැටුම් ඇති කිරිම. | |

05. පිළිවෙළකට අසුරා ඇති භාණ්ඩ අවුල් නොකිරිම.

06. තම ආරක්ෂාව පිළිබඳව සැලකිළිමත් වීම.

07. භාණ්ඩ තේරීමේ දී ඒවාට හානි නොකිරිම.

08. මිලදී ගත් භාණ්ඩ වලට මුදල් නොගෙවීම.


## ක්‍රියාකාරකම 3

- පහත සඳහන් ද්‍රව්‍ය සපයා ගන්න.

01. නූල්
02. 15 × 15 cm ප්‍රමාණයේ රෙදි කැබැල්ලක් (මුද්‍රිත නොවන)
03. ටැපැස්ට්‍රි ඉදි කටුවක් (තුඩ මොට ඉදිකටුවක්)

*රූපසටහනේ දැක්වෙන පරිදි රෙදි කැබලි වල ඉරි කීපයක් සටහන් කරන්න.

* එම ඉරි මත නූල් දුව වන්න.



# ක්‍රියාකාරකම 4

- පහත සඳහන් ද්‍රව්‍ය සපයාගන්න.


  1 .A4 ප්‍රමාණයේ කඩදාසියක්
  2. ගම්
  3. කතුරු
  4. කුකුල් සායම්/ දිය සායම්
  5. සීල් මුද්‍රණය සඳහා සුදුසු ද්‍රව්‍ය
  (බණ්ඩක්කා/ දඹල/ කරවිල/නෙළුම් අල)

❖ A4 කොළයේ එක් පැත්තක දියර වර්ණ යොදා ගෙන සීල් මුද්‍රණය කිරිමට යොමු කරන්න.

❖ සීල් මුද්‍රණය සහිත කඩදාසිය හොඳින් වියලා ගන්න.

❖ සීල් මුද්‍රණය සහිත කඩදාසිය පහත ආකෘතියට අනුව සකස් කර ගන්න.

❖ කඩ ඉරිවලින් වෙන් කර ඇති කොටස් නවා සීල් මුද්‍රණය සහිත පැත්ත පිටට සිටින සේ අලවා කවරයක් ලෙස සකස් කරන්න.



# ක්‍රියාකාරකම 5

*ඔබ කෙනෙකුට උදවු උපකාර කළ අවස්ථාවක් ලියා එය චිත්‍රයට නඟන්න.